# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2150/51 - 2019 නොවැම්බර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2019.11.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන විසිනි**

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

සංශෝධනයයි

**කාර්යක්ෂම සේවා විභූෂණය**

නියෝග

අංක 412/20 හා 1986 අගෝස්තු මස 01 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද කාර්යක්ෂම සේවා විභූෂණය සඳහා වන නියෝගවල සිව්වනුව, සත්වනුව, අටවනුව, නවවනුව, එකොළොස්වනුව, දොළොස්වනුව, තෙළෙස්වනුව, තුදුස්වනුව සහ පසළොස්වනුව ඡේදයන් පහත දක්වා ඇති පරිදි සංශෝධනය කරනු ලැබේ.

සිව්වන ඡේදය : මෙම විභූෂණය සඳහා සුදුසුකම් ලැබීමට මෙහි මින්මතු සඳහන් කෙරෙන රෙගුලාසි වල දක්වනු ලබන කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සක්‍රීය සේවයේ සම්පූර්ණ වශයෙන් විසිපස් වසරක කාර්යක්ෂම අධිකාරීලත් සේවයක් සපුරා ඇති බ්‍රිගේඩියර් හා ඉන් ඉහළ නිලයන්හි නිලධාරීන් විය යුතු බවද, එහෙත් එසේ සම්පූර්ණ කර ඇති සේවා කාලය වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ කාර්යක්ෂම සේවය සඳහා පිරිනමනු ලබන වෙනත් පදක්කමකින් උපහාර දක්වා තිබීම මගින් බලපෑමක් සිදුනොවන බවද මෙයින් නියම කරනු ලැබේ.

සත්වන ඡේදය : මීට කලින් කාර්යක්ෂමතා පදක්කමක් හෝ කාර්යක්ෂමතා සේවා පදක්කම සඳහා ගණන් ගෙන ඇති සේවයක් මෙම විභූෂණය සඳහා සුදුසුකම් ලබාදෙන සේවයක් ලෙස ගණන් ගතහැකි බව මෙයින් නියම කරනු ලැබේ.

අටවන ඡේදය : විභූෂණය ලබා ගැනීමට අවශ්‍ය කරන සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධාරීන් කාර්යක්ෂම වූ ද, එම විභූෂණය ලැබීමට සර්වප්‍රකාරයෙන්ම යෝග්‍ය වන අන්දමේ පරිපූර්ණ හැකියාවන්ගෙන් සමන්විත වූ ද, නිලධාරීන් බවට එම සේවා කාලය ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක විසින් සහතික කරන ලදුව අවසන් වශයෙන් එය ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති විසින් අනුමත කර ඇත්නම් මිස නැතහොත් අවශ්‍ය සුදුසුකම් ලැබීමේ සේවය සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට වුවද මෙම විභූෂණය ප්‍රදානය නොකළ යුතු බව මෙයින් නියම කරනු ලැබේ.

නවවන ඡේදය : කාර්යක්ෂම සේවා ලාභියෙක් සිය ජීවිත කාලය තුළදී දෙවැනි වරක එම පළඳනාව හෝ ඇමුණුම් පටක් මගින් පිදුම් නොලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

එකොළොස්වන ඡේදය: විභූෂණය ප්‍රදානයක් වශයෙන් ලැබූ අයට ඇතැම් අවස්ථා වලදී පැළඳිය හැකි වනසේ විභූෂණයේ කුඩා ප්‍රමාණයේ ප්‍රතිනිර්මාණ එකී කාර්යක්ෂම සේවා විභූෂණයේ නියම ප්‍රමාණයෙන් භාගයක් විය යුතු යැයි මෙයින් නියම කරනු ලැබේ.

දොළොස්වන ඡේදය : කාර්යක්ෂම සේවා විභූෂණයේ සහ කුඩා ප්‍රතිනිර්මාණ වලදී මුද්‍රා තැබූ මෝස්තර ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ අදාළ බලධාරියා විසින් තබාගත යුතු යැයි මෙයින් නියම කරනු ලැබේ.

තෙළෙස්වන ඡේදය : කිසියම් පුද්ගලයෙකුට ප්‍රදානය කර ඇති විභූෂණය අවලංගු කොට නිෂ්ප්‍රභ කරන ලෙස ආරක්ෂක ලේකම් විසින් හෝ ඔහු මගින් කරනු ලබන නිර්දේශයක් පිට මගේ මුද්‍රාව සහ අත්සන සහිත නියෝගයකින් එබඳු පුද්ගලයෙකුගේ විභූෂණය අවලංගු කොට නිෂ්ප්‍රභ කිරීමේ බලය මා සතු විය යුතු බවත් එසේම එම බලය තෝරා පත් කර ගනු ලබන මගේ අනුප්‍රාප්තිකයන්ද සතු විය යුතු බවත් එසේ අවලංගු කොට නිෂ්ප්‍රභ කිරීමෙන් පසු ඔහුගේ නම එකී ප්‍රදානයන් වාර්තා ගත කර ඇති රෙජිස්ටරයෙන් කපා අස්කළ යුතු බවත් එහෙත් එකී නිර්දේශය ඉල්ලා අස් කර ගනු ලැබූ විටක එම විභූෂණය ප්‍රතිසාධනය කිරීමේ බලය මා හෝ මගේ තෝරා පත් කර ගනු ලැබූ අනුප්‍රාප්තිකයන් සතු විය යුතු බවත් මෙයින් නියම කරනු ලැබේ.

තුදුස්වන ඡේදය : මෙම විභූෂණය ප්‍රදානය කිරීම අහිමි කිරීම යළි ලබාදීම සහ වෙනත් කරුණු සම්බන්ධයෙන් මගේ මෙම ප්‍රකාශනයේ සඳහන් දේ වඩාත් විස්තර කොට ඒ සඳහා මගේ අනුමැතිය ආරක්ෂක ලේකම් මගින් ලබා ගෙන වරින් වර ශ්‍රී ලංකා යුද්ධ හමුදාපති විසින් නිකුත් කළ යුතු වන අන්දමේ රෙගුලාසි යටතේ එම විභූෂණය ප්‍රදානය කළ යුතු යැයි මෙයින් නියම කරනු ලැබේ.

පසළොස්වන ඡේදය : මගේ මුද්‍රාව හා අත්සන යටතේ හෝ මගේ ආඥාව යටතේ නිකුත් කරනු ලබන නිවේදනයක් මගින් මෙම ව්‍යවස්ථා සහ රෙගුලාසි සියල්ලම හෝ එයින් ඕනෑම කොටසක් අවලංගු කිරීමේ ද, අහෝසි කිරීමේ ද, වර්ධනය කිරීමේ ද, අර්ථ නිරූපනය කිරීමේ හෝ අතහැර දැමීමේ ද සම්පූර්ණ බලතල මා වෙතම සහ මගේ තෝරා පත් කර ගනු ලැබූ අනුප්‍රාප්තිකයන් වෙත ද රඳවා තබා ගනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

උදය ආර්. සෙනෙවිරත්න,
ජනාධිපති ලේකම්.

2019 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

12 - 114/1

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන විසිනි**

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

සංශෝධනයයි

**කාර්යක්ෂම සේවා පදක්කම**

නියෝග

අංක 412/20 හා 1986 අගෝස්තු මස 01 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද කාර්යක්ෂම සේවා පදක්කමට අදාළ ගැසට් නිවේදනයේ දෙවන ඡේදයේ සහ එහි දක්වෙන නියෝගවල සිව්වනුව, පස්වනුව, හයවනුව, සත්වනුව, අටවනුව, නවවනුව, දහවනුව, එකොළොස්වනුව, දොළොස්වනුව, සහ තෙළෙස්වන ඡේදයන් පහත දක්වා ඇති පරිදි සංශෝධනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ අධිකාරිලත් නිලධාරින්ගේද, බලලත් නිලධාරීන්ගේද, අධිකාරි නොලත් නිලධාරීන්ගේද, සෙබළුන්ගේද, දීර්ඝ වූත් කාර්යක්ෂම වූත් පක්ෂපාත වූත් සේවයට සහ විශිෂ්ට තත්ත්වයේ ආදර්ශමත් චර්යාවට උපහාර දැක්වීම මාගේ අභිප්‍රාය වන බැවින්,

සිව්වන ඡේදය : ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ සක්‍රීය ලැයිස්තුවේ සම්පූර්ණ වශයෙන් අවුරුදු දහඅටක කාර්යක්ෂම සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අධිකාරිලත් නිලධාරීන්ද, බලලත් නිලධාරීන්ද, අධිකාරි නොලත් නිලධාරීන්ද, සෙබළුන්ටද මෙහි මින් මතු සඳහන් රෙගුලාසිවල නියම කර ඇති ආකාරයේ කොන්දේසිවලට යටත්ව මෙම පදක්කම ප්‍රදානය කළ යුතු බවත්, එසේ වුවද මෙම පදක්කම ප්‍රදානය කළ යුත්තේ එසේ ඉටුකරන ලද සේවා කාලය වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ කාර්යක්ෂම සේවය සඳහා වූ වෙනත් කිසියම් පදක්කමක් මීට කලින් ප්‍රදානය කර නැත්නම් පමණක් බව මෙයින් නියම කරනු ලැබේ.

පස්වන ඡේදය : මෙම පදක්කම ප්‍රදානය කරනු ලැබීමට අවශ්‍ය කරන සේවා කාලය සම්පූර්ණ කර ඇති ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ එකී අධිකාරිලත් නිලධාරින්ද, බලලත් නිලධාරින්ද, අධිකාරි නොලත් නිලධාරින් සහ සෙබළුන්ටද කාර්යක්ෂම වූ ද මෙම පදක්කම ලැබීමට සර්වප්‍රකාරයෙන්ම යෝග්‍ය වන අන්දමේ පරිපූර්ණ හැකියාවන්ගෙන් සමන්විතවූ ද අධිකාරිලත් නිලධාරින්, බලලත් නිලධාරින්, අධිකාරි නොලත් නිලධාරින් සහ සෙබළුන් බවට එම සේවා කාලය තුළ සේවය කළ ඒකකයේ අණදෙන නිලධාරි විසින් නිර්දේශ කරන ලදුව එකී නිර්දේශය අදාළ රෙජිමේන්තු අධිපති විසින් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායක විසින් සහතික කරන ලදුව අවසන් වශයෙන් එය ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති විසින් අනුමත කර තිබිය යුතු බව මෙයින් නියම කරනු ලැබේ.

හයවන ඡේදය : ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ උප සේවයේ නියුක්ත අධිකාරිලත් නිලධාරීන්ද, බලලත් නිලධාරීන්ද, අධිකාරි නොලත් නිලධාරින් සහ සෙබළුන් එම උප සේවයෙහි තබනු ලැබූ අවස්ථාවේ මෙම පදක්කම සඳහා අවශ්‍ය කරන සුදුසුකම් ලැබීමේ සේවය ඔවුන් සතුව තිබුණේ නම් ද එකී සේවය ස්වේච්ඡා බළසේනාවේ කාර්යක්ෂම සේවා වෙනුවෙන් වෙන යම් පදක්කමක් මගින් උපහාර දැක්වීම සඳහා ගණන් ගෙන නැත්නම් ද එම නිලධාරීන්ට මෙම පදක්කම සඳහා ඉල්ලුම් කිරීමට හිමිකම් ඇති බවට මෙයින් නියම කරනු ලැබේ.

සත්වන ඡේදය : මෙම පදක්කම ප්‍රදානය කරනු ලැබීමෙන් පසු අධිකාරිලත් නිලධාරීන් ද, බලලත් නිලධාරීන් ද, අධිකාරි නොලත් නිලධාරින් සහ සෙබළුන් විසින් සිය ජීවිත කාලය තුළදී දෙවැනි වරක එම පළඳනාව හෝ ඇමුණුම් පටක් මගින් පිදුම් නොලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

අටවන ඡේදය : ඡේදයේ දක්වා ඇති රෙගුලාසි මෙයින් අවලංගු කෙරේ.

නවවන ඡේදය : පදක්කම ප්‍රදානය කරනු ලැබූ අධිකාරිලත් නිලධාරීන් හා බලලත් නිලධාරින්ට ඇතැම් අවස්ථාවලදී පැළඳිය හැකිවන කාර්යක්ෂම සේවා පදක්කමේ කුඩා ප්‍රමාණයේ මුද්‍රා තැබූ මෝස්තර වූ කලී එකී කාර්යක්ෂම සේවා පදක්කමේ නියම ප්‍රමාණයෙන් භාගයක් විය යුතු යැයි මෙයින් නියම කරනු ලැබේ.

දහවන ඡේදය : කාර්යක්ෂම සේවා පදක්කම මුද්‍රා තැබූ මෝස්තරද එම පදක්කමේ කුඩා අනුරූ ද ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ නිසි බලධාරියා විසින් තබාගත යුතු යයි මෙයින් නියම කරනු ලැබේ.

එකොළොස්වන ඡේදය: කිසියම් පුද්ගලයෙකුට ප්‍රදානය කර ඇති පදක්කම අවලංගු කොට නිෂ්ප්‍රභ කරන ලෙස ආරක්ෂක ලේකම් විසින් හෝ ඔහු මගින් කරනු ලබන නිර්දේශයක් පිට මගේ මුද්‍රාව සහ අත්සන සහිත නියෝගයකින් එබඳු පුද්ගලයෙකුගේ පදක්කම අවලංගු කොට නිෂ්ප්‍රභ කිරීමේ බලය මා සතු විය යුතු බවත් එසේම එම බලය තෝරා පත් කර ගනු ලබන මගේ අනුප්‍රාප්තිකයන් ද සතු විය යුතු බවත් එසේම අවලංගු කොට නිෂ්ප්‍රභ කිරීමෙන් පසු ඔහුගේ නම එකී ප්‍රදානයන් වාර්තා ගත කර ඇති රෙජිස්ටරයෙන් කපා අස් කළ යුතු බවත් එහෙත් එකී නිර්දේශ ඉල්ලා අස් කර ගනු ලැබූ විටක එම පදක්කම ප්‍රතිසාධනය කිරීමේ බලය මා හෝ මගේ තෝරා පත් කර ගනු ලැබූ අනුප්‍රාප්තිකයන් සතු විය යුතු බවත් මෙයින් නියම කරනු ලැබේ.

දොළොස්වන ඡේදය : මෙම පදක්කම ප්‍රදානය කිරීම, අහිමි කිරීම, යළි ලබාදීම සහ වෙනත් කරුණු සම්බන්ධයෙන් මගේ මෙම ප්‍රකාශනයේ සඳහන් දේ වඩාත් විස්තර කොට ඒ සඳහා මගේ අනුමැතිය ආරක්ෂක ලේකම් මගින් ලබා ගෙන වරින් වර ශ්‍රී ලංකා යුද්ධ හමුදාපති විසින් නිකුත් කළ යුතු වන අන්දමේ රෙගුලාසි යටතේ එම පදක්කම ප්‍රදානය කළ යුතු යැයි මෙයින් නියම කරනු ලැබේ.

තෙළෙස්වන ඡේදය : මගේ මුද්‍රාව හා අත්සන යටතේ හෝ මගේ ආඥාව යටතේ නිකුත් කරනු ලබන නිවේදනයක් මගින් මෙම ව්‍යවස්ථා සහ රෙගුලාසි සියල්ලම හෝ එයින් ඕනෑම කොටසක් අවලංගු කිරීමේ ද, අහෝසි කිරීමේ ද, වර්ධනය කිරීමේ ද, අර්ථ නිරූපනය කිරීමේ හෝ අතහැර දැමීමේ ද සම්පූර්ණ බලතල මා වෙතම සහ මගේ තෝරා පත් කර ගනු ලැබූ අනුප්‍රාප්තිකයන් වෙත ද රඳවා තබා ගනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

උදය ආර්. සෙනෙවිරත්න,
ජනාධිපති ලේකම්.

2019 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

12 - 114/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.